**කුවේට් අරමුදල්වලින් පාලම් ප්‍රතිසංස්කරණය පුනරුත්ථාපන කිරීමේ ව්‍යාපෘතිය - 2015**

-----------------------------------------------------------------------------------------------

කුවේට් අරමුදල්වලින් පාලම් ප්‍රතිසංස්කරණය පුනරුත්ථාපන කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල අතර 1995 මාර්තු 27 දින හා 2001 සැප්තැම්බර් 03 දින එළඹි පිළිවෙලින් අංක 466 හා අංක 627 දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, එවකට මහාමාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනවල ප්‍රවාහන පිරිවැය අඩු කිරීම හා දිවයිනේ පළාත් හා අග නගරය අතර ගමන් කිරීමට ගත වන කාලය අඩු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට සහය දීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,432 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 10.12 ක් වන අතර ඉන් රු.මිලියන 1,728.2 සමාන කුවේට් ඩිනාර් මිලියන 5.10 ක් සැපයීම සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල එකග වී තිබුණි. 1995 මාර්තු 27 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කළ අතර 1997 දෙසැම්බර් 31 වන විට මාස 33 ක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත් ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2016 මාර්තු 24 දින දක්වා තවත් වර්ෂ 19 කින් අවස්ථා 10 කදී දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණන මතය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපාතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැඟීමකට පත්වනපරිදි සසදා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5** <u>තත්වාගණන විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

**2.** <u>මූල්‍ය ප්‍රකාශන</u>

**2.1** <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයෙන් දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූරණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**3. <u>මූල්‍ය හා භෞතික කාර්ය සාධනය</u>**

**3.1 <u>අරමුදල් උපයෝජනය</u>**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකග වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම** | **උපයෝජනය කළ අරමුදල්** | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | **සමාලෝචිත වර්ෂය තුල** | | **2015 දෙසැම්බර් 31 දිනට** | |
| | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා කුවේට් අරමුදල | 5.10 | 1,728 | 44.03 | 0.098 | 44.03 | 3.78 | 1,667.79 |
| ශ්‍රී ලංකා රජය | 5.02 | 1,704 | 17.75 | -------- | 17.20 | ------ | 1,686.51 |
| | 10.12 | 3,432 | 61.78 | 0.098 | 61.23 | 3.78 | 3,354.30 |

ඉහත සඳහන් තොරතුරු අනුව ව්‍යාපෘති කාලය 2016 මාර්තු 24 දින දක්වා කාලය දීර්ඝ කර ඇතත්, මුලු ප්‍රතිපාදනය වූ කුවේට් ඩිනාර් මිලියන 5.10න් සියයට 74.12 නියෝජනය වන කුවේට් ඩිනාර් මිලියන 3.78 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව ව්‍යාපෘතිය විසින් වෙන්කල අරමුදල් උපරිම උපයෝජනය සඳහා ව්‍යාපෘතිය මූල්‍ය හා භෞතික සැලසුම් පිළියෙලකොට ක්‍රියාත්මකකර නොතිබුණුබව පැහැදිලිය.

## 3.2 <u>භෞතික ප්‍රගතිය</u>

ලැබී ඇති තොරතුරු අනුව ජාතික මහා මාර්ගවල පටු හා දුර්වල පාලම් 32ක් පුනරුථාපනය, නැවත ඉදිකිරීම් හා නැවත ස්ථාපිත කිරීම හා ගැටබේ ගන්නෝරුව මාර්ගය පුලුල් කිරීම ව්‍යාපෘතියේ කටයුතු වලට ඇතුලත් අතර එම වැඩ 2011 අප්‍රේල් මස නිමකර තිබුණි. තවද ව්‍යාපෘතිය ආරම්භයේදී වැඩ කරගෙන යැමෙන් ඉතිරි වූ කුවේට් ඩිනාර් 256.224ක් උපයෝගීකර ගෙන ගාල්ල-දෙනියාය-මාදම්පේ මාර්ගය පාලම් 03ක් නැවත ඉදිකර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව එම ඉදිකිරීම් වැඩ 2014 දෙසැම්බර් 31 දින වන විට නිම කර තිබුනත් ව්‍යාපෘති කාලය 2016 මාර්තු 24 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 3.3 <u>කොන්ත්‍රාත්තු පරිපාලනය</u>

2016 සැප්තැම්බර් 22 දින විගණකවරුන් විසින් ගාල්ල දෙනියාය මාර්ගයේ කරන ලද ස්ථානීය පරීක්ෂණයේදී පාලම් අංක 1/3,2/1 හා 51/1 පැති දෙකේම කෙලවර ප්‍රසාරණය රොලය (Expensing Joints) වල ඇස්පෝල්ට් තාර යෙදීම නියමාකාරයෙන් කර නොමැති බව අනාවරණය විය. තවද පාලම් අංක 1/3 ගාල්ල කෙලවරේ කානු බැම්ම හා Copping Beam අතර හා පාලම් අංක2/1 දෙනියාය කෙලවරේ Copping Beam හා පැති බැම්ම අතර හිදස් පෙන්නුම්කර තිබුණි. පාලම් අංක 51/1 gabion wall නියමආකාරයෙන් ඉදිකර නොතිබුණු අතර පාලමේ දෙනියාය කෙලවර හානි වී තිබුණි.

## 3.4 <u>ඵලදායී නොවන ගනුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ඉඩම් අත්සන් කර ගැනීමේ කටයුතුවල වන්දි නිරවුල් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් රු. මිලියන 69 ක පොලී ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට ඍජු සම්බන්ධයක් නැති විවෘත කිරීමේ උත්සවය සඳහා රු. මිලියන 5.9 ක් වැයකර තිබුණි.